සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

(01) ස් පධමග, සරිග, සනි යනුවෙන් අවරෝහණ යෙදෙන රාගයේ
(1) මේලය ඛමාජ වේ. (2) ගාන සමය දිවා දෙවන ප්‍රහරය වේ.
(3) වාදී සංවාදී ප, ස් වේ. (4) ජාතිය ඖඩව සම්පූර්ණ වේ.
(5) කෝමල නිෂාධය යෙදේ. (........)

(02) අද්ව දර්ශක ස්වරය නමින් හඳුන්වන්නේ හින්දු ස්ථානි සංගීතයේ කුමන ස්වරයද ?
(1) ස (2) ප (3) ම
(4) නි (5) ග (........)

(03) රාගයෙහි ආරෝහණ අවරෝහණ ක්‍රමය අනුව සෘජුව භාවිතාකරන තාන් හඳුන්වන්නේ කුමන නමකින්ද ?
(1) වක්‍ර තාන් (2) සපට්තාන් (3) බෝල් තාන්
(4) අලංකාරික තාන් (5) රූපක් තාන් (........)

(04) දෙවියන්ගේ ගුණ වර්ණනා කරමින් දෙවියන් සඳහාම ගයන කර්නාටක ගීත ශෛලිය,
(1) කීර්තනම් (2) භජන් (3) වර්ණම්
(4) පදම් (5) ගසල් (........)

(05) රාගධාරී සංගීතයේ මීන්ඩ් යන ශිල්ප ක්‍රමයට උදාහරණයක් වන්නේ,
(1) මමරි මමරි (2) ගස නිප (3) ස ධ රි ස
(4) මමප(ම)ගම (5) ගමප |මග (........)

(06) කර්ණාටක සංගීතයේ තිශ්‍ර ජාති තිපුට තාලයට සමාන හින්දුස්ථානි තාලය වන්නේ,
(1) රූපක් තාලය. (2) එක් තාලය.
(3) දාදාරා තාලය. (4) ජප් තාලය.
(5) ඛෙම්ටෝ තාලය. (........)

(07) සමග්‍රහ, බලිය, මාත්‍රා ගණන එක හා සමාන වූ තාල යුගලය,
(1) දාදරා තාලය ත්‍රි තාලය (2) කෙහෙර්වා ජප් තාලය (3) රූපක් දිප්චන්දි තාලය
(4) ත්‍රිතාල් තීලවඩා (5) දාදරා රූපක් (........)

(08) රාගධාරී සංගීතයේ වාදනයට පමණක් සුවිශේෂී අංගය වනුයේ,
(1) තිහායි (2) කන්
(3) ජලා (4) උපජ්
(5) ආලාප (........)

(09) තබ්ලාවේ බයාවෙන් පමණක් උපදින අක්ෂරය වන්නේ.
(1) ක, ත, ධා (2) ධිං, ගෙ, න (3) ග, ක, කත්
(4) තිං, දා, ති (5) ධ, තිං, ග (........)

(10) එක්තරා සංගීත පද්ධතියක ස්වර සාධනය 'නම්', බැරුං, ගුලු, දදා, පොලොග් ආදි වශයෙන් ස්වර නම් කරයි. එම සංගීත පද්ධති කුමක්ද ?

(1) චීන සංගීත පද්ධතිය (2) ගැමිලෑන් සංගීත පද්ධතිය (3) ඉස්ලාමික් සංගීත පද්ධතිය

(4) කර්ණාටික් පද්ධතිය (5) බටහිර සංගීත පද්ධතිය. (........)

- **අංක 11 - 20 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(11) හින්දුස්ථානි අර්ථ රහිත අක්ෂර වලින් පමණක් රචිත ගායන ශෛලිය හඳුන්වන්නේ කුමන නමකින්ද ?

..........................................................................................................................................

(12) දෙවියන්ට සෙත් පතා කරන ශාන්තිකර්මයක් නම්කරන්න.

..........................................................................................................................................

(13) රි, ප වාදී සංවාදී වන රාගයක් නම් කරන්න.

..........................................................................................................................................

(14) අදාරංග, සදාරංග විසින් රචනා කළ ගායන ශෛලිය කුමක්ද ?

..........................................................................................................................................

(15) කෝලම් නාටකයේ මූලිකත්වය ගෙන කටයුතු කරන චරිතය හඳුන්වන්නේ කෙසේද ?

..........................................................................................................................................

(16) ලංකාවේ ප්‍රථම නූර්තිය කුමක්රුන්ද ?

..........................................................................................................................................

(17) එහි නිෂ්පාදකයා කවුද ?

..........................................................................................................................................

(18) බිහාග් රාගයට අදාළ ස්වර 5 කින් සමන්විත විශේෂ ස්වර ඛණ්ඩයක් ලියන්න.

..........................................................................................................................................

(19) ''සුරතට රැගෙන පන්දම යාගෙට ඇඳුරා'' මෙම ගීතය අයත්වන්නේ කුමන ශාන්තිකර්මයටද ?

..........................................................................................................................................

(20) චතුරංග ගීතයක දැක්වෙන කොටස් මොනවාද ?

..........................................................................................................................................

- **අංක 21 සිට 30 දක්වා වූ ප්‍රශ්නවල වැරදි නිවැරදි කියමන් ලකුණු කරන්න. වැරදි නම් x ලකුණද, හරි නම් ✓ ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(21) ඩීනාරි යනු සිතාරයේ ප්‍රධානම තතයි. (........)

(22) එක්තාලයේ සිව්වන මත්‍රාවේ පිහිටා ඇත්තේ තක් යන අක්ෂරයයි. (........)

(23) කෝමල ස්වර එකක් පමණක් යෙදෙන මේජර් ස්කේලය වන්නේ G major Scale යයි. (........)

(24) පිලිප්පු සිංඤෝ විසින් නිර්මාණය කරන ලද්දේ නාඩගම්ය. (........)

(25) හංසරාජිණී නම් සරල ගීතය භාගෙශ්‍රී රාගය ආශ්‍රිතව නිර්මාණය කර ඇත. (........)

(26) කොහොඹා කංකාරිය කෝට්ටේ යුගයේ ඇති වූ මුල්ම ශාන්තිකර්මයයි. (........)

(27) දොහොරාව සහිත තූර්ති ගීතයකි සෝහමාන දේව පුරා. (........)

(28) බාල මුරලි ක්‍රිෂ්ණා දකුණු ඉන්දියාවේ ප්‍රසිද්ධ තිලානා නිර්මාණ ශිල්පියෙකි. (........)

(29) කර්ණාට පද්ධතියේ ස්වර 12 ක් භාවිතා වේ. (........)

(30) භාරතීය සංගීතය වඩාත් උචිත වන්නේ ඒකල ගායන වාදන සඳහාය. (........)

- **අංක 31 -35 දක්වා වූ ප්‍රශ්න වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(31) විජය කුමරු ලංකාවට පැමිණි දිනයේ ........................................................ පැවැත්වූයේ යයි කියන විවාහ මංගල උත්සවයේදී තූර්යවාදනයන් යුක්ත වූ බවත්, ........................................................ සඳහන් වේ.

(32) සංගීත භාණ්ඩ වාදනය ඓතිහාසිකව පැවති බවට ........................................................ ඇති වාමන රූප වලින් සහ ................................................................................ ඇති කැටයම් වලින් පැහැදිලි වේ.

(33) මහා පැරකුම්බා රජු විසින් ඉදිකරන ලද ........................................................ සංගීත නැටුම් සඳහා විවෘත වූ අතර ................................................................................ නමින් පවත්වා ගෙන ගිය සංගීත බලකායක්ද වූ බව චූල වංශයේ සඳහන් වේ.

(34) දඹදෙණි යුගයේදී රචිත ........................................................ සහ ........................................................ යන ග්‍රන්ථවල සංගීත භාණ්ඩ රාශියක් එකල භාවිතා වූ බව සඳහන් වේ.

(35) මහනුවර යුගයේදී සංගීත භාණ්ඩ වාදනය පිළිබඳ තොරතුරු හමුවේ. බටහිර සුෂිර වාද්‍ය භාණ්ඩ වලින් සමන්විත ................................................................................ අංශයත්, පෝය හේවිසි ආදිය සඳහා බෙර දවුල් හොරණෑ වාදනය කළ ........................................................ අංශයත් රජවාසල ප්‍රචලිත අංශ දෙකකි.

(36) ''ඔක්ස්ෆර්ඩ්'' ශබ්දකෝෂයේ 'සංගීතය' යන්න නිර්වචනය කර ඇත්තේ,

(1) ගායනය, වාදනය සහ නැටීම යන කරුණු තුනේ එකතුව සංගීතයයි.

(2) සමූහ ගායනය සංගීතයයි.

(3) හැඟීම් ප්‍රකාශනය සඳහා නාද සංයෝජනය කිරීමේ කලාව සංගීතයයි.

(4) සමූහ වාදනය සංගීතයයි.

(5) රසවත් වූ තනු නිර්මාණය සංගීතයයි.

(37) හින්දුස්ථානි රූපක් තාලයට සමානව මාත්‍රා බෙදෙන කර්ණාටක තාල පදය වනුයේ,

(1) මිශ්‍ර ජාති එක්තාලයයි. (2) තිශ්‍ර ජාතී රූපක තාලයයි. (3) ඛණ්ඩ ජාතී ජබ්වතාලයයි.

(4) තිශ්‍ර ජාති ත්‍රිපුට තාලයයි. (5) තිශ්‍ර ජාති අට තාලයයි. (........)

(38) ගීතයක හෝ වාදනයක ආරම්භයේ සිට සමස්ථානය දක්වා ගැයෙන වැයෙන කොටස නම් කරන්න.

(1) ආලාප (2) උජ්ප (3) මුඛඩා

(4) තිහායි (5) ස්ථායි

(39) පහත සඳහන් ගී වර්ග සේ ගී ගනයට අයත් වේ.

(1) ප්‍රශස්ති, නාඩගම්, හටන්, වැලපුම්. (2) හටන්, තූර්ති. වන්නම්, ටීකා. සීපද

(3) ප්‍රශස්ති, හටන්. වන්නම්, වැලපුම්. (4) බැති ගී, ප්‍රශස්ති, වැලපුම්, වන්නම්

(5) ප්‍රශස්ති, හටන්, වැලපුම්, ශාන්තිකර්ම ගී (........)

(40) තිලක්කාමෝද් රාගය අයත් වන මේලය වන්නේ,

(1) ඛමාජ්ය (2) ආශාවරිය (3) බිලාවල්ය

(4) භෛරවීය (5) කාෆිය (........)

- **අංක 41 - 50 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

(41) වයලීනය හා සිතාරය සූක්ෂම සුසුර කිරීම (Fine Tuning) සඳහා යොදාගැනෙන කොටස් දෙක නම් කරන්න.

...................................................................................................................................................

(42) රාගයක වාදී සංවාදී හැරුනු විට ඉතිරි ස්වර ............................................................................ නමින් හඳුන්වන අතර ආශාවරී රාගයේ වාදී සංවාදී ස්වර වන්නේ ............................................................ හා ............................................................ යි.

(43) දේශීය තිත් තාල පද්ධතිය අනුව තනි තිතේ සහ දෙතිතේ ප්‍රභේද සංඛ්‍යාව පිළිවෙලින් ලියන්න.

...................................................................................................................................................

(44) සාම්ප්‍රදායික වැදි ගී නාද මාලා තුළින් ප්‍රතිනිර්මිත නූතන සරල ගී 2 ක් නම් කරන්න.

...................................................................................................................................................

(45) දක්ෂිණ භාරතීය වන්නම් ගායන ශෛලියෙහි ආකෘතියට අයත් කොටස් දෙකක් නම් කරන්න.

...................................................................................................................................................

(46) ම ප , නි ධ ප, ධ ම, ප ග, රි ම ප යන මුඛ්‍යාංග ස්වර වලින් හඳුන්වනු ලබන රාගය කුමක්ද ?

...................................................................................................................................................

(47) ජයජයවන්ති රාගයේ මේල ස්වර ලියන්න.

...................................................................................................................................................

(48) සමාන විභාග සහිත මාත්‍රා 12 ක තාලයක නම් ලියන්න.

...................................................................................................................................................

(49) තානාලංකාර වර්ග 3 ක් නම් කරන්න.

...................................................................................................................................................

(50) ගැමිලදන් සංගීතය යනුවෙන් හඳුන්වන්නේ කුමන රටක පවතින කුමන සංගීතයද?

...................................................................................................................................................

(2 x 50 = 100)

The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## පෙරදිග සංගීතය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **I කොටසින් ප්‍රශ්න දෙකකටද, II කොටසින් එක් ප්‍රශ්නයකටද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද වනසේ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න..**

### I කොටස

01. (i) පහත සඳහන් සවර කාණ්ඩ කුමන රාගයට අයත් දැයි නම් කරන්න.

(a) ස̇, නි̲ ධ ප  ධ ම, රි ග̲ රි ස

(b) ප̣, නි̣ ස, රි ග, රි ප ම ග, නි̣ ස

(c) ම ග̲ රි ස, ධ̣ නි̲ ස, ම (ල. 06)

(ii) ඉහත රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ ගත් එකක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 10)

(iii) ඉහද (c) කොටසට අයත් රාගයේ ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී මේල ස්වර ලියා දක්වන්න. (ල. 04)

02. (i) පහත සඳහන්ව ඇත්තේ නිර්දේශිත රාගවලට අයත් සර්ගම් ගී පාදයන්ය. ස්වරයෙහි රාග නම්කරන්න.

(a) ප̣ ප̣ | රි රි රි | රි රි | රි ග̲ ස

(b) රි ස | නි̲̣ ධ̣ නි̲̣ | ස | ම ග̲ ග̲

(c) නි̣ ප̣ නි̣ ස | රි ග නි̣ ස | රි ග රි ස | ම ග නි̣ ස

(d) ග ස | ග ම | ප නි ප | ග ම (ල. 04)

(ii) (c) කොටසට අයත් සර්ගම් ගීතය ලියා දක්වන්න. (ල. 08)

(iii) (a) කොටසට අයත් රාගයේ මධ්‍යලය ගීතයට අදාළව තානාලංකාර 02 ක් නිර්මාණ කරන්න. (ල. 04)

(iv) (d) කොටසට අයත් රාගයට අදාළව ස්වර 30 කට නොඅඩු ආලාප ඛණ්ඩයක් නිර්මාණය කරන්න. (ල. 04)

03. භාරතීය රාගධාරි සංගීතය උත්තර හා දක්ෂිණ වශයෙන් පද්ධති දෙකකි.

(i) මෙම පද්ධති දෙකෙහි සමාන අසමානතා 4 බැගින් ලියා දක්වන්න. (ල. 08)

(ii) පහත දැක්වෙන කොටස් අතරින් 02 ක් තෝරාගෙන එම කොටසේ ගායන ශෛලීන් දෙක අතර සැසැඳීමක් කරන්න.

(අ) භජන් කීර්තනම්  (අ) තරාණා තිල්ලානා  (ඇ) ධ්‍රැපද් ධමාර්තිල් (ල. 06)

(iii) ධ්‍රැපද් ගීතයක ස්ථායි කොටසේ මුල් පාද දෙක ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 06)

## II කොටස

04. (i) ආසාතාත්මක අනාසාතාත්මක වශයෙන් දේශීය ගී දෙවර්ගය විස්තර කරන්න. (ල. 08)

(ii) ශාන්තිකර්ම ගී තුළින් මතුවන ගැමි සමාජයේ ඇදහිලි, විශ්වාස පිළිබඳ නිදසුන් දක්වමින් විමසුමක් කරන්න. (ල. 08)

(iii) ශාන්තිකර්ම ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න .(ල. 04)

05. (i) මහනුවර යුගයට දකුණු ඉන්දියානු බලපෑම එල්ලවීමට බලපෑ සාධක මොනවාද ? (ල. 05)

(ii) මහනුවර යුගයේ රාජ සභා සංගීතය සඳහා පිහිට වූ ආයතන 3 ක් නම් කරන්න (ල. 03)

(iii) සංගීතය සම්බන්ධයෙන් පොලොන්නරු යුගයේදී කැපී පෙනෙන දායකත්වයක් සැපයූ රජතුමා නම්කර ඒ බව සනාථ කරලීමට ඇති හේතු සැකෙවින් දක්වන්න. (ල. 08)

(iv) අනුරාධපුර යුගයේ සංගීතමය තොරතුරු 04 ක් සඳහන් කරන්න. (ල. 04)

## III කොටස

06. කෝලම් යනු ශ්‍රී ලංකාවේ පැරණිතම රංග සම්ප්‍රදායන් අතරින් එකකි.

(i) කෝලම් රංග ශෛලීය ව්‍යාප්ත වූ ප්‍රදේශ මොනවාද? (ල. 04)

(ii) කෝලම් රංග ශෛලිය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ල. 04)

(iii) කෝලම් ගීතයක පළමු පාද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(iv) කෝලම් රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ 04 ක් ලියා දක්වන්න. (ල. 04)

07. (i) පහත සඳහන් කරුණු වලින් දෙකක් තෝරාගෙන විස්තර කරන්න.

★ හටන් ප්‍රශස්ති සම විෂමතා

★ උඩරට සබරගමු වන්නම් වල ආරම්භය ව්‍යාප්තිය හා සුවිශේෂ ලක්ෂණ

★ ආසාතාත්මක වැලපුම් ගී අනාසාතාත්මක වැලපුම් ගී. (ල. 08)

(ii) ආසාත්ත්මක වැලපුම් ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 04)

(iii) එම ගීතයේ මුල් පාදයේ සදෘස්මත්, ගීමත් ගණන ගණනය කරන්න. (ල. 04)

(iv) සබරගමු වන්නමත් තානම සහිතව කවියත් ලියා දක්වන්න. (ල. 04)

08. (i) නිර්දේශිත තාල ඇසුරෙන් පහත දැක්වෙන විස්තර ගැලපෙන තාල 4 නම් කරන්න.

A මෙම තාලය තබ්ලාවෙන්ද, විවෘතාංගයෙන්ද වැයිය හැකි අතර පක්වාජ් නම් භාණ්ඩයට සුවිශේෂී වේ.

B විලම්භලය ඛ්‍යාල් ගීත සඳහා සුවිශේෂී වන මෙම තාලයේ විභාග 06 කි.

C මෙම තාලයේ අටවන මාත්‍රාවේ ඛලි ස්ථානය පිහිටයි. (ල. 12)

D මෙම තාලය ඛලියෙන් ආරම්භ වේ. විභාග 03 කි.

(ii) A, B යන තාල පද යුගලය ප්‍රස්ථාර කරන්න. (ල. 04)

(iii) තාල හා සම්බන්ධ පහත දැක්වෙන සංකල්පය කෙටියෙන් හඳුන්වන්න.